මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ මෝටර් රථ රියදුරන් බඳවා ගැනීම හා උසස් කිරීම සඳහා
ඒකාබද්ධ රියදුරු සේවා ව්‍යවස්ථා සංග්‍රහය සංශෝධනය - අංක 01

| ඡේද අංකය | දැනට තිබෙන පෙළ | ඡේද අංකය | යෝජිත සංශෝධනය | සංශෝධනයට හේතු |
|---|---|---|---|---|
| 9.1.4 (ඇ) | මධ්‍යම පළාත තුළ අවම වශයෙන් අවුරුදු 03ක වත් ස්ථිර පදිංචිය ඇති පිරිමි අයදුම්කරුවන් විය යුතුය. ඡන්ද හිමි නාමලේඛනය හෝ ප්‍රාදේශීය ලේකම් විසින් අනුමත කරන ලද ග්‍රාම නිලධාරී සහතිකය මගින් පදිංචිය සනාථ කළ යුතුය. | 9.1.4 (ඇ) | අයදුම්පත් භාරගන්නා අවසන් දිනට පූර්වාසන්න වසර 03 ක මධ්‍යම පළාත තුළ ස්ථිර පදිංචිය ඇති පිරිමි අයදුම්කරුවන් විය යුතුය. ඡන්ද හිමි නාමලේඛනය හෝ ප්‍රාදේශීය ලේකම් විසින් අනු අත්සන් කරන ලද ග්‍රාම නිලධාරී සහතිකය මගින් පදිංචිය සනාථ කළ යුතුය. | අයැදුම්කරුවන්ගේ පදිංචිය සනාථකරගැනීමේ ක්‍රමවේදය පැහැදිළිව සඳහන් කිරීම |
| 9.2 | **බඳවා ගැනීමේ ක්‍රමය**<br>රජයේ ගැසට් පත්‍රයේ හෝ ප්‍රසිද්ධ පුවත්පත්වල දැන්වීම් පලකිරීම් මගින් අයැදුම්පත් කැඳවීමෙන් පසු අයැදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයකට භාජනයකර බඳවා ගැනීමේ මූලික සුදුසුකම් සපුරා ඇති (අංක 09 යටතේ සඳහන් ) අයවලුන් පමණක් ලිඛිත පරීක්ෂණයකට පෙනී සිටීමෙන් අනතුරුව රියදුරු තනතුරට අදාළවන පරිදි ලිඛිත හා ප්‍රායෝගික පරීක්ෂණයක ප්‍රතිඵල මත වැඩිම ලකුණු ලබා ගැනීමේ පදනම මත බඳවා ගැනේ.<br><br>III වන පන්තියේ පුරප්පාඩුවලින් 50% ක් බාහිර අයැදුම්කරුවන්ගෙන්ද 50% අභ්‍යන්තර අයැදුම්කරුවන්ගෙන්ද පුරවනු ලැබේ. සුදුසුකම් | 9.2 | **බඳවා ගැනීමේ ක්‍රමය**<br>රජයේ ගැසට් පත්‍රයේ හෝ ප්‍රසිද්ධ පුවත්පත්වල දැන්වීම් පලකිරීම් මගින් අයදුම්පත් කැඳවනු ලැබේ. අයදුම්පත් පරීක්ෂා කිරීමෙන් පසු සුදුසුකම් රහිත අයදුම්පත් ප්‍රතික්ෂේප කිරීමෙන් අනතුරුව සුදුසුකම් සහිත අයදුම්පත් ඉදිරිපත් කර ඇති අයදුම්කරුවන් සඳහා ලිඛිත පරීක්ෂණයක් පවත්වනු ලැබේ. ලිඛිත පරීක්ෂණය සමත් අයදුම්කරුවන් ලබා ගත් ලකුණු ප්‍රමුඛතාවය අනුව බඳවා ගැනීමට අපේක්ෂිත සංඛ්‍යාව මෙන් දෙගුණයක් ප්‍රායෝගික පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ. ලිඛිත පරීක්ෂණය සමත් වී | අයදුම්පත් පරීක්ෂා කිරීමෙන් පසු සුදුසුකම් රහිත අයදුම්පත් ප්‍රතික්ෂේප කළ හැකි වීම හා අයදුම්පත් විශාල ප්‍රමාණයක් ලැබෙන බැවින් සියලුම අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයකට කැඳවීමේදී විශාල |

අනුමත කරමි / නොකරමි

පී. බී. දිසානායක
මධ්‍යම පළාත් ආණ්ඩුකාරවර

2018..07..13

| | | | | |
|---|---|---|---|---|
| | සම්පූර්ණ කළ අභ්‍යන්තර අයදුම්කරුවන් ප්‍රමාණවත් සංඛ්‍යාවක් නොමැති විට එම ප්‍රමාණය බාහිර අයදුම්කරුවන්ගෙන්ද, සුදුසුකම් සම්පූර්ණ කළ බාහිර අයදුම්කරුවන් ප්‍රමාණවත් සංඛ්‍යාවක් නොමැති විට එම ප්‍රමාණය අභ්‍යන්තර අයදුම්කරුවන්ගෙන්ද ප්‍රතිශතය නොසලකා පුරවනු ලැබේ.<br><br>අනුමත කරමි / නොකරමි<br>[illegible]<br>මධ්‍යම පළාත් ආණ්ඩුකාරවර<br>2018/07/13 | | ප්‍රායෝගික පරීක්ෂණය සමත් වූවන්ගේ ලිඛිත හා ප්‍රායෝගික පරීක්ෂණවල ලකුණු එකතුවෙහි ප්‍රමුඛතාවය අනුව බඳවා ගැනීම සිදු කරනු ලැබේ.<br><br>ලිඛිත පරීක්ෂණය සමත්වීම සඳහා අවම වශයෙන් ලකුණු 40%ක් ද, ප්‍රායෝගික පරීක්ෂණය සමත්වීම සඳහා අවම වශයෙන් ලකුණු 40%ක් ද ලබාගත යුතුය.<br><br>III වන පන්තියේ පුරප්පාඩුවලින් 50% ක් බාහිර අයදුම්කරුවන්ගෙන්ද 50% අභ්‍යන්තර අයදුම්කරුවන්ගෙන්ද පුරවනු ලැබේ. සුදුසුකම් සම්පූර්ණ කළ අභ්‍යන්තර අයදුම්කරුවන් ප්‍රමාණවත් සංඛ්‍යාවක් නොමැති විට එම ප්‍රමාණය බාහිර අයදුම්කරුවන්ගෙන්ද, සුදුසුකම් සම්පූර්ණ කළ බාහිර අයදුම්කරුවන් ප්‍රමාණවත් සංඛ්‍යාවක් නොමැති විට එම ප්‍රමාණය අභ්‍යන්තර අයදුම්කරුවන්ගෙන්ද ප්‍රතිශතය නොසලකා පුරවනු ලැබේ.<br><br>ලිඛිත හා ප්‍රායෝගික පරීක්ෂණ මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පවත්වනු ලැබේ. | වියදමක් හා කාලයක් ගතවීම වැළක්වීම සඳහා |

<table>
<tr>
<td>(ඇ)<br>උපලේඛනය</td>
<td>බඳවා ගැනීමේ ලිඛිත පරීක්ෂණයේ විෂය නිර්දේශය<br><br>
<table>
<tr><td>විෂය</td><td>කාලය</td><td>ලකුණු</td></tr>
<tr><td>01.මාර්ග නීති පිළිබඳව දැනුම හා මෝටර් යාන්ත්‍රික විද්‍යාව පිළිබඳ සාමාන්‍ය දැනුම</td><td>පැය 01</td><td>100</td></tr>
<tr><td>02.වැඩ පැමිණීම හා හැසිරීම</td><td>පැය 01</td><td>100</td></tr>
<tr><td>මුළු ලකුණු</td><td></td><td>100</td></tr>
</table>
<br>ලිඛිත හා ප්‍රායෝගික පරීක්ෂණය මධ්‍යම පළාත් රාජ්‍යසේවා කොමිෂන් සභාවේ ලේකම් විසින් පවත්වනු ලැබේ. විභාගය සමර්ථය සඳහා ලිඛිත පරීක්ෂණයෙන් සහ ප්‍රායෝගික පරීක්ෂණයෙන් අවම වශයෙන් ලකුණු 40% ක් බැගින් ලබා ගත යුතුය.</td>
<td>(ඇ)<br>උපලේඛනය</td>
<td>බඳවා ගැනීමේ ලිඛිත පරීක්ෂණයේ විෂය නිර්දේශය<br>
<table>
<tr><td>විෂයයන්</td><td>කාලය</td><td>උපරිම ලකුණු ප්‍රමාණය</td><td>සමත් ලකුණු ප්‍රමාණය</td></tr>
<tr><td>මාර්ග නීති පිළිබඳව දැනුම හා මෝටර් යාන්ත්‍රික විද්‍යාව පිළිබඳ දැනුම</td><td>පැය 02</td><td>100%</td><td>40%</td></tr>
</table>
</td>
<td>විවෘත බඳවා ගැනීම්වලදී අනුමත සේවා ව්‍යවස්ථාවේ සඳහන් "වැඩ පැමිණීම හා හැසිරීම" විෂයය සඳහා විභාගයක් පැවත්වීම ප්‍රායෝගික නොවීම.</td>
</tr>
</table>

අනුමත කරමි / නොකරමි

පී. බී. දිසානායක
මධ්‍යම පළාත් ආණ්ඩුකාරවර
2018.07.13

කොමිෂන් සභාවේ නිර්දේශය:- නිර්දේශ කරමු.

01. ගාමිණී දසනායක මහතා (සභාපති) ....................................

02. ජී.ජී.එස්.ඒ. දිසානායක මහත්මිය (සාමාජික) ....................................

03. වී. නන්දකුමාර් මහතා (සාමාජික) ....................................

04. ඒ.ජේ.එම්.එම්. නිස්තාර් මහතා (සාමාජික) ....................................

05. ඩබ්.එම්.එස්.ඩී. වීරකෝන් මහතා (සාමාජික) ....................................

දිනය:-2018.06..26.

ආණ්ඩුකාර ලේකම්,

2018.06. 26. දිනැති කොමිෂන් සභා වාර්තාවේ අංක .....18/753..... යටතේ කොමිෂන් සභාව විසින් නිර්දේශ කරන ලද මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ මෝටර් රථ රියදුරන් බඳවා ගැනීමේ හා උසස් කිරීම සඳහා ඒකාබද්ධ රියදුරු සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ සංශෝධනය - අංක 01, ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය සඳහා කාරුණිකව ඉදිරිපත් කරමි.

ආර්.එම්.එන්. රත්නායක
ලේකම්
මධ්‍යම පළාත් රාජ්‍ය සේවා
කොමිෂන් සභාව.

මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය.

දිනය:-2018.07.05

**අනුමත කරමි / ~~නොකරමි~~**

....................................
පී. බී. දිසානායක
මධ්‍යම පළාත් ආණ්ඩුකාරවර
20 18/07/13